Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 07 - 2023

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## පිළිතුරු පත්‍රය

### I කොටස

01. 3
02. 2
03. 1
04. 4
05. 1
06. 3
07. 4
08. 2
09. නුවණ
10. කිරණ
11. 1
12. මුවන්
13. කිරිල්ලියක්
14. පූර්ව ක්‍රියා
15. මිශ්‍ර ක්‍රියා
16. ආනයන
17. බාහිර
18. i. ප්‍රසිද්ධ, ප්‍රචලිත, පසිඳු
    ii. සඳ, චන්ද්‍රයා, තාරපති, හිමකර
19. i. මොර කන්නා    ii. ඉන්න
20. (4) උපමා

### II කොටස

01. 1. (අ) ඛ, ඡ, ඨ, ථ, ඵ, ඝ, ඣ, ඪ, ධ, භ
       (ආ) වචනවල අක්ෂර වින්‍යාසය සලකා ලකුණු පිරිනමන්න.
    2. (අ) 547
       (ආ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
    3. i. ගොයම් කැපීමෙන් පසු ගොයම් ගසේ ඉතිරි කොටස
       ii. ආප්ප
       iii. අන්තේවාසිකයා / යටත් වැසියා / ශිෂ්‍යයා / ගෝලයා
       iv. සිහිකිරීම
    4. (අ) අපි බලු පැටවා / බලු පැටවුන් සමඟ සෙල්ලම් කළෙමු.
       (ආ) ලේන්නු ඉදුණු අඹයක් / අඹ කති.
    5. (අ) දල්වන පහන
       (ආ) පාෂාණ
       (අරුත් දනවන නිවැරදි උක්තාඛ්‍යාත සම්බන්ධ වාක්‍ය සඳහා ලකුණු පිරිනමන්න.)

02. රචනය සඳහා

| | ලකුණු |
|---|---|
| 1. මාතෘකානුකූල බව | 07 |
| 2. නිර්මාණශීලී බව, ස්වීයත්වය | 10 |
| 3. ශිල්පීය දක්ෂතා (විරාම ලක්ෂණ, අක්ෂර වින්‍යාසය, උක්තාඛ්‍යාත සම්බන්ධය සලකා) | 03 |
| මුළු ලකුණු | 20 |

03. (අ) (ආ)

| | |
|---|---|
| i. ආකෘතිය | 03 |
| ii. අන්තර්ගතය | 05 |
| iii. ශිල්පීය දක්ෂතා | 02 |
| මුළු ලකුණු | 10 |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04. (අ) 1. අම්මා වෙහෙස වී වැඩ කළා ය.
2. අපි උදෑසනින් අවදි වී පාසල් යෑමට සූදානම් වුනෙමු.
3. නුඹ ක්‍රීඩා පිට්ටනියට ගියෙහි.
4. ඈ කන්කලු ගීතයක් ගැයුවාය.
5. ඔවුහු හොඳින් පාඩම් කළහ.

(ආ) 1. මිනිස්සු සර්පයෙකු දැක බිය වූහ.
2. නුඹලා අප සමඟ අමනාප වූවෙහු.
3. තාරකාවෝ අහසේ බබළති / තාරකා අහසේ බබළයි.
4. අම්මා මා දෙස බලා සතුටු කඳුළු හෙළයි / හෙළන්නීය.
5.. අපි නිරතුරුව ඔවුන් විශ්වාස කළෙමු.

05.

| පාඩමේ නම | කවුද? | කාහටද? |
|---|---|---|
| 1. ඔයි රයිරේ ඔයිරාමා | බණ්ඩාර මැණිකේ/සිරිමල්ගේ මව | දාවිත් රාළහාමි/සිරිමල්ගේ පියා |
| 2. ගොවි බිරිඳගෙ නුවණ | ව්‍යාඝ්‍රයා | හිවලාට |
| 3. තිලමුට්ඨි ජාතකය | බ්‍රහ්මදත්ත රජතුමා | තල වේලූ කාන්තාව/මහලු ස්ත්‍රිය |
| 4. නිවේදන | මුදිත | සමිත |
| 5. කතාබහට සංයමයක් | තාත්තා/පියා | නිමල්ට |

06. i. තම්බපණ්ණි, ටැප්‍රොබේන්
ii. ලිඛිත, අඛණ්ඩ, භාරතයෙන්, ක්ෂේම භූමියක්
iii. ශීත ප්‍රදේශ කෙරෙන් පියඹා එන පක්ෂීන් පරිද්දෙන්
iv. 1. නරපතියෙක් 2. සරතැස
v. සරතැසට පත් සංචාරකයන්ට ලක්දිව ඉතා සැපදායක පරිසරයක් ඇති ක්ෂේම භූමියක් වීම

07. 1. පැන් බොන්නට ළිඳක් දුටිම්
බැත උඩ සිට මුහුද දුටිම්
2. පෙරළි පෙරළි සෙල්ලම් කොට
දිය රැල්ලට එක් වෙලා,
3. අඹ දලු ළා රත තවරන්නී
ලෝ කත විසිතුරු කරලන්නී
4. කර පුද වඳින රැඳි මුනි සිරිපා තඹර
සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර
5. නැහැ එහි සකි
සමනල යෙ කි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 07 - 2023

## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 06 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. වර්තමාන සිංහල අක්ෂර මාලාවේ ඇති මුළු අක්ෂර ගණන,
    1. 59 කි. 2. 57 කි. 3. 60 කි. 4. 61 කි.

02. මධ්‍යම පුරුෂ අතීත කාල බහු වචන ක්‍රියා පදය වන්නේ,
    1. කරන්නෙහු 2. කළෙහු 3. කරහු 4. කරහි

03. ඒකවචන අනුක්ත නාම පදයක් වන්නේ,
    1. මා 2. ඔවුන් 3. දියණියක් 4. සිංහයෙක්

04. උපසර්ගයක් සහිත වචනය වන්නේ,
    1. ඉසුරුමත් 2. ස්වාධීන 3. සමස්ත 4. අවමානය

05. කමත් භාෂාවේ "මෝල්කඩ" යන යෙදුම සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන පදය වන්නේ,
    1. අම්බරුවන් කමතට ඇතුළුවන පාර 2. ආහාර අනුභව කිරීම
    3. කමතේ හරක් ගැට ගසන කණුව 4. අම්බරුවන් දිරිමත් කරන හඬ

06. ඉරි ඇඳි පදයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

    වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වීමට නම් සියලු දෙනා <u>අත්වැල් බැඳගෙන</u> කටයුතු කළ යුතු බව විදුහල්පතිතුමා පැවසුවේ ය.
    1. අත් අල්ලාගෙන 2. ක්‍රීඩාවක යෙදෙමින් 3. එකට එක් වී 4. සාකච්ඡා කරමින්

- 07- 08 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

07. 1. මර්ධනය 2. පරිඝණකය 3. විෂේශ 4. පුරාවෘත්ත

08. 1. දේශණය 2. සාකච්ජා 3. ඓතිහාසික 4. වර්ථමාන

- 09 - 10 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

09. අපි සියල්ලෝ ම නැණ .......................... දියුණු කර ගැනීමට කටයුතු කරමු. (නුවණ / නුවන)

10. ඔවුහු පුර පසළොස්වක පෝය දා සඳ ....................................... වැටී සුන්දර වූ දාගැබ් මළුවේ සිට වැව දෙස බලා සිටියහ. (කිරන / කිරණ)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **ඉරි ඇඳ ඇති වාක්‍යාංශයට ගැළපෙන තනි පදය තෝරන්න.**

11. ඔහු තමා ගැන පමණක් සිතා කටයුතු කරන අයෙකු බැවින් සියල්ලෝ ම ඔහු ප්‍රතික්ෂේප කළහ.
    1. ආත්මාර්ථකාමී  2. පරාර්ථකාමී  3. ස්වෛරී  4. ඒකාධිකාරී

- **අංක 12 සහ 13 ප්‍රශ්නවල වාක්‍ය සම්පූර්ණ කිරීමට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

12. වැද්දෝ ...................................... මරති. (මුවෙක් / මුවන් / මුවෝ)

13. ........................................... ඉතා වෙහෙස වී දුර ඈත පියඹා ගොස් පැටවුන්ට කෑම ගෙනාවාය. (කිරිල්ලියක් / කිරිල්ලියක / කිරිල්ලියෝ)

- **අංක 14 සහ 15 ප්‍රශ්නවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා පද වර්ගය තෝරා ඉරක් අඳින්න.**

14. නංගී උදෑසන ම මල් නෙළා බුදුන් වඳියි. (මිශ්‍ර ක්‍රියා / පූර්ව ක්‍රියා / අවසාන ක්‍රියා)

15. ඔවුහු දියට පැන දිය බුං ගසමින් ප්‍රීතියෙන් නෑවෝ ය. (මිශ්‍ර ක්‍රියා / පූර්ව ක්‍රියා / අවසාන ක්‍රියා)

- **අංක 16 සහ 17 ප්‍රශ්නවල දී ඇති පදයට විරුද්ධ පදය ලියන්න.**

16. අපනයන - .......................................................................

17. අභ්‍යන්තර - .......................................................................

- **අංක 18 ප්‍රශ්නයට දී ඇති පදයට සමානාර්ථ පදය බැගින් ලියන්න.**

18. i. ප්‍රකට - .......................................................................

    ii. තරිඳු - .......................................................................

- **අංක 19 ප්‍රශ්නය සඳහා දී ඇති ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.**

19. i. අතු කඩා ........................................................................... වගේ

    ii. මඩේ හිට වූ ................................................................. වගේ

- **අංක 20 ප්‍රශ්නයේ ඉරි ඇඳි පදය අයත් කාව්‍ය අලංකාරය කුමක් ද?**

20. ගස වතුසුදු - වී පිරිසිඳු
    පොහොය නැතිඳු - සිල්ගත් බඳු
    1. අනුප්‍රාසය  2. රූපක  3. එළිසමය  4. උපමා

(ලකුණු 2 × 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමු, දෙවන හා තෙවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න (5) පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**01. කෙටි පිළිතුරු සපයන්න.**

01. (අ) මහාප්‍රාණ අක්ෂර 5ක් ලියා දක්වන්න.
    (ආ) මහාප්‍රාණ අක්ෂර යෙදෙන වචන 2ක් ලියන්න.

02. (අ) පන්සිය පනස් ජාතක පොතේ ඇති ජාතක කතා ගණන කීයද?
    (ආ) සැලළිහිණි සන්දේශය රචනා කළේ කවුරුන් විසින් ද?

03. (අ) පහත වචනවල අරුත් ලියන්න.
    i. ඉපනැල්ල - ii. කිරිකබළු -
    iii. අතවැස්සන් - iv. අනුස්මරණය -

04. පහත වාක්‍ය බහු වචනයට හරවා ලියන්න.
    (අ) මම බලු පැටියා සමග සෙල්ලම් කළෙමි.
    (ආ) ලේනා ඉඳුණු අඹයක් කයි.

05. පහත වචනවල අරුත් පැහැදිලි වන සේ වාක්‍යය ලියන්න.
    (අ) පහන - (ආ) පහණ -

(ලකුණු 10)

**02. පහත මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150ක පමණ රචනයක් ලියන්න.**

1. වන අසිරිය රැක ගනිමු.
2. මහ වනයක අතරමං වීම්.
3. පියකරු උදෑසනක්.
4. දේශීය ආහාර රටාවට හුරු වෙමු.
5. ශ්‍රී ලංකාවේ ලෝහ තාක්ෂණය

(ලකුණු 20)

**03. (අ) සහ (ආ) යන කොටස් දෙකින් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.**

(අ) ඔබේ පාසලේ පැවැත්වීමට නියමිත වාර්ෂික කලා මංගල්‍යය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමියට දන්වා යවන ආරාධනා පත්‍රය සකස් කරන්න.
- දිනය : 2023 ඔක්තෝබර් 20
- ස්ථානය : හිඟුරක්ගොඩ ආනන්ද විද්‍යාලයීය ශ්‍රවණාගාරය
- වේලාව : පෙ. ව. 9.00

(ආ) ඔබේ ගුරුතුමියගේ 45 වන ජන්ම දිනයට සුබ පතමින් උපන් දින සුබ පැතුමක් නිර්මාණය කරන්න.

**04. (අ) පහත වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.**

1. අම්මා වෙහෙස වී වැඩ කරයි.
2. අපි උදෑසනින් අවදි වී පාසල් යෑමට සූදානම් වෙමු.
3. නුඹ ක්‍රීඩා පිට්ටනියට යන්නෙහි.
4. ඈ කන්කලු ගීතයක් ගයයි.
5. ඔවුහු හොඳින් පාඩම් කරති.

**(ආ) පහත වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න.**

1. මිනිසුන් සර්පයෙකු දැක බිය වූහ.
2. නුඹලා අප සමඟ අමනාප වූවෙහි.
3. තාරකා අහසේ බබළති.
4. අම්මා මා දෙස බලා සතුටු කඳුළු හෙළමි.
5. අපි නිරතුරුව ඔවුහු විශ්වාස කරමු.

(ලකුණු 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**05. පහත සඳහන් ප්‍රකාශ ඇතුළත් පාඩමේ නම කා විසින් කාහට කියන ලද දැයි යන්න වගුගත කරන්න.**

1."අපි ගිහින් එන්නම් රාලහාමි......"

2."බැහැ, බැහැ, ඔබ මා එතැනට කැඳවා ගෙන ගොස් පැන දුවාවි....."

3."ඇයි මැණියනි, මම කුමන අන්‍යායක් කෙළෙම් ද?

4."අන්න! කවුද ළමයෙක් නැතිවෙලා ලු......."

5."ඔව් ගිහින් වරෙන්, නැත්තං කුමාරිහාමිලා තරහා වෙයි...."

| | පාඩමේ නම | කා විසින් ද? | කා හට ද? |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

**06. පහත කවි සම්පූර්ණ කරන්න.**

1. ගලක් පළා ගලක් දුටිම්
එගල පළා රිදී දුටිම්

.......................................................

.......................................................

2. නෙලුම් කොළේ නොම ඇලී
දිය බිඳුවක ගැලි ගැලී

.......................................................

.......................................................

3. ජම්බු ගහට රත පොරවන්නී
බක්මී ගහ කහ අන්දන්නී

.......................................................

.......................................................

4. සුරරද සමන් සමඟින් සුරඟන එවර
පැහැනද මදාරා පරසතු මල් පතර

.......................................................

.......................................................

5. මහ පුදුමෙකි
මලක මලෙකි

.......................................................

.......................................................

(ලකුණු 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**07. ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ලිඛිත ඉතිහාසයෙනුත් ඔබ්බට යන අතීතයක් ඇති ලක්දිව පිළිබඳ ව නොයෙක් ජනප්‍රවාද සහ වෘත්තාන්ත ගෙතී ඇත්තේ ය. එහි ලිඛිත ඉතිහාසය ක්‍රි. පූ. 6 වැනි සියවසේ පටන් අද දක්වා අඛණ්ඩ ව පවතී. සිසිර කාලය ළඟා වෙද්දී හිමෙන් ගොඩබිම වැසීයත් ම ශීත ප්‍රදේශ කෙරෙන් පියාඹා එන පක්ෂීන් පරිද්දෙන් ග්‍රීසිය, රෝමය වැනි අපරදිග රාජ්‍යවලින් ද මිසරය, අරාබිය වැනි මැදපෙරදිග දේශවලින් ද ආසන්නයේ පිහිටි භාරතයෙන් සහ ඈත පෙරදිග චීනයෙන් ද, අතීතයේ පටන් ම විදේශ සංචාරකයෝ ලක්දිවට ඇදී ආහ. සරතැසට පත් සංචාරකයන්ට ලක්දිව ඉතා සැපදායක පරිසරයක් ඇති ක්ෂේම භූමියක් වීම ඊට හේතුවයි. පැරණි ලෝකයේ ග්‍රීක සහ අරාබි වෙළඳ යාත්‍රාකරුවන් විසින් ලංකාව ස්වකීය පෙරදිග සංචාරවල දී ගොඩබැසීමට සුදුසු ස්ථානයක් ලෙස සලකන ලද බව පෙනේ. මෙය යුදෙව් නරපතියෙකු වූ සොලමන් රජු රන්, රිදී, ඇත්දත් සහ මොනරුන් සැපයූ ඕෆිර් සහ ටාශිෂ් ප්‍රදේශයේ කොටසක් ලෙස අතීතයේදී සැලකුණේ ය. අශෝක ටැම් ලිපිවල තම්බපණ්ණි නමින් ද, පැරණි ග්‍රීකයන් සහ රෝමවරුන් විසින් තැප්‍රොබේන් යන නමින් ද මේ දිවයින හැඳින්විණි.

1. මෙම ඡේදයේ සඳහන් ශ්‍රී ලංකාව හැඳින්වීමට භාවිත කළ නම් දෙකක් ලියන්න.
2. මහාප්‍රාණ අක්ෂර සහිත වචන දෙකක් ලියා දක්වන්න.
3. මෙහි සඳහන් උපමාවක් ලියන්න.
4. පහත වචනවලට සමාන පද ඡේදයෙන් සොයා ලියන්න.
   1. රජතුමා 2. වෙහෙස
5. විදේශ සංචාරකයන් ලක්දිවට ඇදී ආවේ ඇයි?

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com